# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,648 — 1966 ජනවාරි 27 වැනි බ්‍රහස්පතින්ද — 1966.1.27

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (III) වැනි ඡේදය — වෙළෙඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර පිළිබඳ දැන්වීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සැම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| වෙළෙඳ ලකුණු පිළිබඳ දැන්වීම් ... ... | 9 | මෝස්තර ආඥාපනත යටතේ නිවේදන ... ... | — |
| වෙළෙඳ ලකුණු පිළිබඳ නිවේදන ... ... | | විවිධ දැන්වීම් ... ... ... ... | — |
| පේටන්ට් බලපත්‍ර ආඥාපනත යටතේ නිවේදන ... ... | 10 | | |


## වෙළෙඳ ලකුණු පිළිබඳ දැන්වීම්

### වෙළෙඳ ලකුණු පිළිබඳ කාර්‍යාලය

වෙළෙඳ ලකුණුවලට අදල සියලුම ලියුම් කියුම් කොළඹ 1, ඇවිලන් චතුරශ්‍රයේ 5 වැනි ගොඩනැගිල්ලේ වෙළෙඳ සමාගම් රෙජිස්ට්‍රාර්ගේ දෙපාර්තමේන්තුවේ වෙළෙඳ ලකුණු රෙජිස්ට්‍රාර් වෙත එවිය යුතුය.

### පරීක්ෂා කිරීමේ වේලාවන්

ආණ්ඩුවේ නිවාඩු දිනයන් හැරුණු විට සතියේ සෙනසුරා හැර සැම දිනකම දහයේ සිට හතර දක්වාද, සෙනසුරාද දිනවලද දහයේ සිට එක දක්වාද ලේඛන පරීක්ෂා කිරීම සඳහා මහජනයා වෙනුවෙන් කාර්යාලය විවෘත කර තබනු ලැබේ. පරීක්ෂා කිරීම සඳහා එවනු ලබන ඉල්ලුම් පත්‍ර සතියේ දිනවල සවස 3 දක්වා ද, සෙනසුරාද දිනවල දවල් 12 දක්වා ද භාරගනු ලැබේ.

### වර්ණවලට සීමාවූ වෙළෙඳ ලකුණු

ලියාපදිංචි කරනු ලැබීමෙන් පසු වෙළෙඳ ලකුණක් යම් යම් වර්ණයන්ට සීමා කරනු ලබන බවට ඉල්ලුම් පත්‍රයක් පිළිබඳ දැන්වීමක සඳහන් වී ඇති කල්හි ඒ සමග ඉදිරිපත් කරනු ලබන වෙළෙඳ ලකුණේ ලාංඡනයෙහි හැකි තරම් දුරට එම වර්ණයන් සංඥානායෙන් ප්‍රචාරය වන අන්දමට දක්වනු ලැබේ.

### ආශ්‍රිත කිරීම

මෙහි පළ කර ඇති වෙළෙඳ ලකුණක් (වෙළෙඳ ලකුණු ආඥා පනතේ 23 වැනි වගන්තිය (150 වැනි පරිච්ඡේදය) යටතේ) තවත් ලකුණක් හා ආශ්‍රිත කොට භාවිත කරනු ලබන බව සඳහන් කර ඇති කල්හි එම වෙළෙඳ ලකුණට දී ඇති අංකයද දක්වනු ලැබේ.

### '' ඒ '' කොටසේ හෝ '' බී '' කොටසේ ඉල්ලීම්

රෙජිස්ටරයේ ''ඒ'' කොටසේ ලියාපදිංචි කිරීම සඳහා කරනු ලබන ඉල්ලීම් කිසිම අක්ෂරයක් නොමැතිවම කාර්‍යාලයීය අංකය සමග දක්වනු ලැබේ. රෙජිස්ටරයේ ''බී'' කොටසේ ලියාපදිංචි කිරීම සඳහා කරන ඉල්ලීම් කාර්‍යාලයීය අංකයට මුලින් ''බී'' අක්ෂරය සහිතව දක්වනු ලැබේ.

### විරෝධය දැක්වීම

පහත සඳහන් වෙළෙඳ ලකුණු ලියාපදිංචි කිරීම පිළිබඳව විරුද්ධවීමට හේතු ඇති කවරකු විසින් හෝ මේ ගැසට් පත්‍රය පළ වන දින සිට දෙමසක් ඇතුළත දී රුපියල් 25 ක අවලංගු නො කරන ලද හෝ ලාංජික මුද්දරයක්ද සමග ටී.ඇම්. 7 දරන පෝරමය මගින් විරෝධතා දැන්වීම ඉදිරිපත් කරන ලෙස මෙයින් දන්වා සිටිනු ලැබේ. රෙජිස්ට්‍රාර් විසින් යුදුසුයැයි සලකනු ලබතොත් විරෝධතා දැන්වීම ඉදිරිපත් කිරීමේ කාලසීමාව ඔහු විසින් නියම කරනු ලබන කොන්දේසි උඩ දීර්ඝ කරනු ලැබිය හැකිය.

ලියාපදිංචි කිරීම ඉල්ලුම් කර සිටින තැනැත්තාට තම ඉල්ලීම අස්කර ගන්නට අවස්ථාවක් සැලසෙනු පිණිස, විරෝධතා දැන්වීම පිළියෙල කිරීමේ වියදම් දැරීමට පෙර සෑහෙන ප්‍රමාණ කාලයක් දී ලියවිල්ලකින් දැන්වීමක් එසේ ඉල්ලුම්කරු වෙත යවා මිස විධිමත් විරෝධතාවක් ඉදිරිපත් නො කළ හැකිය.

විරෝධතාවක් සම්බන්ධයෙන් ඉල්ලුම්කරු විසින් එරෙහිව කරුණු ඉදිරිපත් නො කළහොත් එසේ විරුද්ධ වන්නකු විසින් ගාස්තු අයකර ගැනීමේ නියෝගයක් සඳහා කරනු ලබන ඉල්ලීමක් ගැන සළකා බැලීමේදී යට කී පරිදි දැන්වීමක් යැවීමේ කාර්යය පැහැර හැර තිබීම ද සැළකිල්ලට ගනු ලැබේ.

# පේටන්ට් බලපත්‍ර ආඥපනත යටතේ නිවේදන

## දැන්වීමයි

පහත සඳහන් විස්තර ප්‍රකාශය පිළිගෙන ඇත :—

1964 අප්‍රේල් 6 දින අංක 5,405 (ප්‍රංශයේ අංක පීවී930681 හි 63.4.6 පූර්වතා දිනයට හිමිකම් කියන සම්මුති ඉල්ලුම් පත)

ජූල්ස් අවර්ඩියෝ

"චක් තිර පිළිබඳ හෝ ඒ හා සම්බන්ධ හෝ වැඩි දියුණු කිරීම සහ ඒවා තැනීමේ ක්‍රමය."

**සංක්ෂිප්තය.**—නිමැවුමේ ස්වභාවය පහත සඳහන් අංක 1 හිමිකම් ප්‍රකාශනයෙන් මැන ගත හැකි ය :—

1. චල චිත්‍රපටයක් හෝ එවැනි යමක් හෝ ප්‍රක්ෂේපණය කිරීම සඳහා වූ සමාන්තර ලෙස එකකට එකක් අසලින් පිහිටි ආලෝක විසරණ අවයව සහිත වර්ගයේ චක් තිරයක් නිපැදවීම සඳහා ක්‍රමයක්. එකී ක්‍රමය ලොකු පැති දෙක බොහෝ සෙසින් එකකට එකක් සමාන්තර අන්වායාම පනෝලවලින් සමන්විත වන අතර එක් එක් පනෝලයෙහි යට කී ලොකු පැති දෙකට සමාන්තර ලෙස පිහිටි ආලෝක විසරණ අවයව වෙයි. එකී පනෝල එකී පැති දිගේ ඇලී සිටින සේ තැබීමේ දී එක් එක් අවයවය පනෝලයෙන් පනෝලයට (එක ම පනෝලයෙහි නම් වඩාත් මැනැවි) විචල්‍ය කෝණික පිහිටීමෙක වන සේ එසේ ලැබෙන සාපේක්ෂ පිහිටීම්වල සවි කරනු ලැබේ. අවයවවලට එසේ ලබා දෙන කෝණික පිහිටීම මුළු තිරයේ පනෝලය පිහිටන ආකාරය මත රඳා පවතින අතර එකී අවයවවල ආලෝක විසරණ මූණත් පටයෝ ප්‍රක්ෂේපණ අක්ෂයට ලම්බ දිශාවට බෙහෙවින් සමාන්තර වන පරිදි වෙයි.

හිමිකම් ප්‍රකාශ 31ක් ද චිත්‍ර පත් ඉරු 4ක් ද වෙයි.

එස්. එල්. ද සිල්වා,
පේටන්ට් පිළිබඳ රෙජිස්ට්‍රාර්.

1965 නොවැම්බර 20 දින,
කොළඹ දීය.

1-680/1

---

## දැන්වීමයි

පහත සඳහන් විස්තර ප්‍රකාශය පිළිගෙන ඇත :—

1964 අප්‍රේල් 16 දින අංක 5,409 (එක්සත් ජනපදයේ අංක 18548/63 හි 63.5.10 පූර්වතා දිනයට හිමිකම් කියන සම්මුති ඉල්ලුම් පත)

මෙටල් ක්ලෝෂර්ස් ලිමිටඩ්

"වසුන් සංමුද්‍රා පිළිබඳ වැඩි දියුණු කිරීම්."

**සංක්ෂිප්තය.**—නිමැවුමේ ස්වභාවය පහත සඳහන් අංක 1 හිමිකම් ප්‍රකාශයෙන් මැන ගත හැකි ය :—

1. පිටතින් ඉස්කුරුප්පු පොට සහිත බඳුනක් රික්ත ලෙස සංමුද්‍රණය කිරීම සඳහා වසුන් පියනක්. එය බඳුනෙක මුව හා සංමුද්‍රණය වන පරිදි තැනූ නැටි හැඩයේ රික්ත පියනෙකින් ද මුදුනක් සහිත පිටත වසුන් කවචයෙකින් ද පොට-ලූ නෙරියෙකින් ද නෙරියේ පහත දාරයේ වන ආරක්ෂක පටියෙකින් ද සමන්විත වෙයි. ආරක්ෂක පටිය සවි කර ඇත්තේ එය අඩ වශයෙන් වත් වසුන් කවචයේ නෙරියෙන් මැන් නොකර බඳුනෙන් වසුන් කවචය ඉවත් කළ නොහෙන පරිදි බඳුනේ ඇති නාරටියක් හා ඇමිණැවීමෙනි. රික්ත පියන සකස් කර ඇත්තේ යට කී පිටත වසුන් කවචය බුරුල් වන සේ කැරකීමේ දී, බඳුනෙන් වසුන් කවචය ඉවත් කිරීමට සෑහෙන තරම් ප්‍රමාණයකට වසුන් කවචයේ නෙරියත් ආරක්ෂක පටියත් ඇත් වන තෙක් බඳුනේ සංමුද්‍රණය වෙනස් නොවන පරිද්දෙනි.

හිමිකම් ප්‍රකාශ 11ක් ද චිත්‍ර පත් ඉරු 3ක් ද වෙයි.

එස්. එල්. ද සිල්වා,
පේටන්ට් පිළිබඳ රෙජිස්ට්‍රාර්.

1965 නොවැම්බර 20 දින,
කොළඹ දී ය.

1-680/2

## දැන්වීමයි

පහත සඳහන් විස්තර ප්‍රකාශය පිළිගෙන ඇත :—

1964 අප්‍රේල් 20 දින අංක 5,411 (අමෙරිකා එක්සත් ජනපදයේ අංක 275303 හි 63.4.24 පූර්වතා දිනයට හිමිකම් කියන සම්මුති ඉල්ලුම් පත)

ඇමෙරිකන් ප්ලාංජ් ඇන්ඩ් මැනුපැක්චරිං කො. ඉන්කො

"වැසුම් පියනක් හා එය තැනීමේ ක්‍රමය".

**සංක්ෂිප්තය.**—නිමැවුමේ ස්වභාවය පහත සඳහන් අංක 1 හිමිකම් ප්‍රකාශනයෙන් මැන ගත හැකි ය :—

1. බඳුනෙක කරෙක විවරයක් වටා වූ ගැටියක් උඩින් වැටී සවි වන වංර්ගයේ සැහැල්ලු ලෝහමය වැසුම් පියනක්. එකී පියන තැටියක් වැනි මුදුන් කොටසෙකින් යුක්ත වන අතර ඒ තුළ වලයාකාර වාවුරුවක් වෙයි. එය බඳුනේ බිත්තිය හා ඇලී සිටී. පියනේ මුදුන් කොටසින් ඔබ්බට වටේට විහිදුණු වාටියක් වෙයි. පියනේ ලෝහය තුළට කැවුණු කත්තු යුගලෙකි. ඒවා වාටියේ නිදහස් දාරයෙන් අරඹා පියනේ මුදුනෙන් බාගයක් පමණ දුරට දිවේ. ඒ කත්තු පියන ඉරා ලීමට තීරුවක් සලකුණු කරයි. කත්තු ඇරඹෙන තැන ඒවා අතරින් නිදහස් දාරයේ සිට පිටට විහිදුණු ඉරුම් දිවක් වෙයි. යට කී කත්තු (10, 11; 14, 15; 16, 17) දිගට ම ඒකාකාර හරස්කඩ ඉරවලුවෙකින් යුක්ත යි. යට කී වාවුරුව (25) කත්තු (14, 15) හරහා යන තැන්වල දී එකී කත්තු (14, 15) පිරෙන සේ අඛණ්ඩ ලෙස පැතිරී ඇත. යට කී වාවුරුව යට කී මුදුනේ (2) පර්යන්තයට බෙහෙවින් ආසන්න පිහිටීමෙක (26) සිට යට කී වාටියේ (3) මඳක් පහළින් වන පිහිටීමකට (27) විහිදී ඇත. එකී වාටියේ (3) එකී කත්තු (10, 11) තනනු ලබන්නේ පැතැලි තහඩුවෙකින් පියන (1) තැනීමේ දී ය. කෙසේ ද යත් එකී තහඩුවේ (26) වෘත්තාකාර මැද කොටස රඳවා තබා වලයාකාර පර්යන්ත කොටස එකී තහඩුවෙන් (26) පාර්ශ්වික ලෙස ඇද එකී මැද කොටස හා සලකන කල පාර්ශ්වික පිහිටීමකට එය පැමිණි විට එකී වලයාකාර පර්යන්ත කොටසෙහි (43) කත්තු ලැමෙනි. (වරහන් යෙදූ අංකවලින් දැක්වෙන්නේ විස්තර ප්‍රකාශය හා ඇති රූප යි.)

හිමිකම් ප්‍රකාශ 5ක් ද චිත්‍ර පත් ඉරු 1ක් ද වෙයි.

එස්. එල්. ද සිල්වා,
පේටන්ට් පිළිබඳ රෙජිස්ට්‍රාර්.

1965 නොවැම්බර 20 දින,
කොළඹ දීය.

1-680/3

---

## දැන්වීමයි

පහත සඳහන් විස්තර ප්‍රකාශය පිළිගෙන ඇත :—

1964 අප්‍රේල් 28 දින අංක 5,417 (එක්සත් ජනපදයේ අංක 19508/63 හි 63.5.16 පූර්වතා දිනයට හිමිකම් කියන සම්මුති ඉල්ලුම් පත)

හැරල්ඩ් ඩග්ලස් එඩ්වඩ්ස්

"නිෂ්පාදිත තේවලින් නැටි ඉවත් කිරීම හා සම්බන්ධ වැඩි දියුණු කිරීම්."

**සංක්ෂිප්තය.**—නිමැවුමේ ස්වභාවය පහත සඳහන් අංක 1 හා 2 දරන හිමිකම් ප්‍රකාශවලින් මැන ගත හැකි ය :—

1. තේ කොළවලින් නැටි ඉවත් කිරීමේ ක්‍රමයක්. එය තේ කොළත් නැටිත් සහිත මිශ්‍රණයක් වාෂ්පශීල කාබනික ද්‍රව මාධ්‍ය යෙක ගිල්ලීමෙන් සමන්විත වෙයි. ද්‍රවයේ විශිෂ්ට ගුරුත්වය නැටි මතු වන පරිදිත් තේ කොළ ගිලෙන පරිදිත් වෙයි. ද්‍රවය නැටි සහිත කොටසකටත් කොළ සහිත කොටසකටත් බෙදා ඒ එක් එක් කොටසින් ඝන ද්‍රව්‍ය (පිළිවෙළින් නැටිත් කොළත්) ඉවත් කොට ද්‍රව්‍ය වෙන් කර ගනු ලැබේ.

2. 1 වැනි හිමිකම් ප්‍රකාශයෙන් විස්තර වුණු ක්‍රමයේ ද්‍රවයේ විශිෂ්ට ගුරුත්වය 1.15 සිට 1.35 යන පරාසය තුළ වෙයි.

හිමිකම් ප්‍රකාශ 12ක් ද නිදසුන් 5ක් ද වෙයි.

එස්. එල්. ද සිල්වා,
පේටන්ට් පිළිබඳ රෙජිස්ට්‍රාර්.

1965 නොවැම්බර 20 දින.
කොළඹ දීය.

1-680/4

## දැන්වීමයි

පහත සඳහන් විස්තර ප්‍රකාශය පිළිගෙන ඇත :—

1964 මැයි 23 දින අංක 5424 (එක්සත් ජනපදයේ අංක 21,196/63 හි 63.5.28 හි පූර්වතා දිනයට හිමිකම් කියන සම්මුති ඉල්ලුම් පත)

ඇල්මික් ලිමිටඩ්

"මුත්‍ර බඳුන්, දිය සහිත වැසිකිළි බේසම් ආදිය පවත්වා ගැනීම පිළිබඳ හෝ ඒ සම්බන්ධ වැඩි දියුණු කිරීම්".

**සංක්ෂිප්තය.**—නිමැවුමේ ස්වභාවය පහත සඳහන් අංක 1 හිමිකම් ප්‍රකාශයෙන් මැන ගත හැකි ය :—

1. දියෙන් සෝදා හරින මුත්‍ර බඳුන්, වැසිකිළි බේසම් ආදිය සැලැකිය යුතු තරම් පිරිසිදුවටත් ගඳක් නොමැතිවත් සෞඛ්‍යයට හිතකර අන්දමිනුත් පවත්වා ගැනීමේ ක්‍රමයක්. එය, සෝදා හැරීම් දෙකක් අතරතුර කාලයෙක දී විෂ බීජ නාශක සංයුතියෙන් යුතු ද්‍රුස්‍රාවී සමින් සචල ද්‍රවයෙකින් සාන්ද්‍ර ජලීය ද්‍රාවණයක් ලබා ගෙන සෝදා හැරීමේ දී එකී සාන්ද්‍ර ද්‍රාවණය තනුක කර සෝදා හැරීම අවසන දී එකී තනුක ද්‍රාවණය බඳුන තුළට පිට කිරීමේ ක්‍රමයෙකි.

හිමිකම් ප්‍රකාශ 21ක් ද චිත්‍ර පත් ඉරු 3 ක් ද වෙයි.

එස්. එල්. ද සිල්වා,
පේටන්ට් පිළිබඳ රෙජිස්ට්‍රාර්.

1965 නොවැම්බර 20 දින,
කොළඹ දී.

1-680/5

---

## දැන්වීමයි

පහත සඳහන් විස්තර ප්‍රකාශය පිළිගෙන ඇත :—

1964 ජූලි 23 දින අංක 5,483 (60.7.28 දින එක්සත් ජනපදයේ අංක 9,48,322 හතළිස් හය වැනි ඡේදය යටතේ ලියා පදිංචි කිරීම)

ෂෙල් ඉටනැෂනාලෙ රිසර්ච් මාට්ස්චපිජ් එන්. වී.

"වෙරළින් ඔබ ළිං විදීම පිළිබඳ වැඩි දියුණු කිරීම්."

**සංක්ෂිප්තය.**—නිමැවුමේ ස්වභාවය පහත සඳහන් අංක 1 හිමිකම් ප්‍රකාශයෙන් මැන ගත හැකි ය :—

1. වෙරළින් ඔබ ළිඳක් විද ගමන් කරන යාත්‍රා හා ගැටීමෙන් හානි නොවන පරිදි දිය යට ළිං-හිස් උවාරණ සවි කිරීමේ ක්‍රමයක්. විදුම් යාත්‍රාවෙක සිට විදුම් යත් කඳක් හා විදුම් උපකරණයෙකින් සාගර පත්ලේ මිහිවිදමනක් විදීමෙන් ද මුදුනෙහි ළිං-හිස් ආධාරක හැටුමක් හා ළිං කසුවම් හිසක් සවි කළ සන්නායක නළයක් එහි යටි කෙළවර විදුම් යත් කඳේ කෙළවර ඉන් ඉවත් වීමට පෙර මිහිවිදමනට ඇතුළු වන තෙක් විදුම් යත් කඳ දිගේ පහත් කිරීමෙන් ද යට කී යාත්‍රාව තෙක් දිගැති නියමු යොත් ළිං-හිස් ආධාරක මත සැකැසීමෙන් ද ළිං-හිස් ආධාරක හැටුමත් කසුවම් හිසත් එකී සයුර භාවිත කරන යාත්‍රාවලට අවශ්‍ය ගැඹුරට වඩා වැඩි ගැඹුරෙක පිහිටන සේ යට කී සන්නායක නළය යට කී මිහිවිදමන තුළට පහත් කිරීමෙන් ද යට කී සන්නායක නළය තුළට සිමෙන්ති ලන නළ වැලක් යවා යට කී සන්නායක නළය යට කී මිහිවිදමන තුළ පිහිටන සේ සිමෙන්ති ලෑමෙන් ද යට කී කසුවම් හිස මතට පිපුරුම් නිවාරකයක් පහත් කර ගැලැවිය හැකි පරිදි ඊට ඇදීමෙන් ද ජලයෙන් උඩ තැනක් තෙක් දිගැති නාවුක සන්නායක නළයෙක පහළ කෙළවර තරල වරන අයුරකින් යට කී පිපුරුම් නිවාරකය මත රැඳැවීමෙන් ද එකී නාවුක සන්නායක නළයත් පිපුරුම් නිවාරකයත් සන්නායක නළයත් තුළින් විදුම් යත් කඳක් හා විදුම් උපකරණයක් යැවීමෙන් ද ඉක්බිති මිහිවිදමන දිගින් දිගට ම විදීමෙන් ද එකී ක්‍රමය සමන්විත වෙයි.

හිමිකම් ප්‍රකාශ 16ක් ද චිත්‍ර පත් ඉරු 17ක් ද වෙයි.

එස්. එල්. ද සිල්වා,
පේටන්ට් පිළිබඳ රෙජිස්ට්‍රාර්.

1965 දෙසැම්බර 1 දින,
කොළඹ දී.

1-680/6

---

## දැන්වීමයි

පහත සඳහන් විස්තර ප්‍රකාශය පිළිගෙන ඇත :—

1964 ජූලි 23 දින අංක 5,485 (එක්සත් ජනපදයේ 61.5.8 දින අංක 9,48,326 හතළිස් හය වැනි ඡේදය යටතේ ලියා පදිංචි කිරීම)

ෂෙල් ඉන්ටනැෂනාලෙ රිසර්ච් මාට්ස්චපිජ් එන්. වී.

"ළිං කසුවම් සිමෙන්ති ලෑම"

**සංක්ෂිප්තය.**—නිමැවුමේ ස්වභාවය පහත සඳහන් අංක 1 හිමිකම් ප්‍රකාශයෙන් මැන ගත හැකි ය :—

1. දිය කඳක් මත පිහිටැවූ හැටුමෙක වන උවාරණ මඟින් විදින ලද වෙරළින්-ඔබ ළිඳෙක කසුවම් වැලක් සිමෙන්ති ලෑම. ළිඳ තුළ තැනෙක සිට දිය මතුපිටට ඉහළ තැනකට යන විදුම් යත් වැලක් කසුවම් සඳහා නියමුවක් ලෙස ක්‍රියා කරනු වස් විදුම් යත් වැලෙන් කොටසක් වත් විදි සිදුරේ ඉතිරි කැරෙන පරිදි වූ පියවරෙකින් ද දිය මතුපිටට ඉහළ තැනෙක සිට ළිඳේ මුදුනට වත් දික් වූ ළිං කසුවමක් විදුම් යත් වැල දිගේ සිටින සේ කසුවමේ මුදුනින් එල්ලා තබන පියවරෙකින් ද ඉක්බිති විදුම් යත් වැල කසුවමින් ඉවතට ගෙන කසුවමේ පතුලට ආසන්න පිහිටීමක නවතින සේ සිමෙන්ති රඳනයක් යවා එය කසුවමේ ඇතුළු බිත්තියට සවි කර, කසුවමේ ඉහළ කෙළවර ගැලැවිය හැකි සේ නළ වැලකට ඈඳා ළිඳේ පතුලේ නොව කලින් තීරණය කර ගන්නා ලද ගැඹුරෙක කසුවමේ පතුල සිටින සේ ද කසුවමේ මුදුන ළිඳේ මුදුනින් ඉහළට සිටින සේ ද වූ අවසාන පිහිටීමෙක කසුවම සිටින පරිදි නළ වැලත් කසුවමත් එක විට පහතට යවා, දිය මතුපිටට ඉහළින් වන හැටුමෙන් නළ වැලේ මුදුන් කොන එල්ලා නළ වැල තුළින් ද සිමෙන්ති රඳනයට පහළින් කසුවම තුළින් ද කසුවමේ පිටත දිගේ ඉහළට ද සිමෙන්ති පොම්ප කර කසුවම ළිඳේ සිමෙන්ති ලෑමේ පියවරවලින් ද එකී ක්‍රමය සමන්විත වෙයි.

හිමිකම් ප්‍රකාශ 16ක් ද චිත්‍ර පත් ඉරු 4ක් ද වෙයි.

එස්. එල්. ද සිල්වා,
පේටන්ට් පිළිබඳ රෙජිස්ට්‍රාර්.

1965 දෙසැම්බර 1 දින,
කොළඹ දී.

1-680/7

---

## දැන්වීමයි

පහත සඳහන් විස්තර ප්‍රකාශය පිළිගෙන ඇත :—

1965 මාර්තු 24 දින අංක 5596

මුරුගේසු කෘෂ්ණපිල්ලෙයි

"ප්‍රකර්ෂණ මකනයක්"

**සංක්ෂිප්තය.**—නිමැවුමේ ස්වභාවය පහත සඳහන් හිමිකම් ප්‍රකාශ දෙකින් මැන ගත හැකි යි :—

1. කඳ නැසින්න, පොට ආදියෙහි නිර්මාණය කවරක් වුව ද නැසින්න තුළින් මකන රැහැන අඹරා ප්‍රක්ෂේපණය කිරීමේ ක්‍රමයක්

2. මගේ විස්තර ප්‍රකාශයේ විස්තර කර ඇති පරිදිත් මගේ චිත්‍ර වල නිදර්ශනය කර ඇති පරිදිත් වූ මගේ ක්‍රමයෙන් තැනූ ප්‍රකර්ෂණ මකනයක්.

හිමිකම් 2ක් ද චිත්‍ර පත් ඉරු 1ක් ද වෙයි.

එස්. එල්. ද සිල්වා,
පේටන්ට් පිළිබඳ රෙජිස්ට්‍රාර්.

1965 නොවැම්බර් 20 දින,
කොළඹ දී.

1-680/8

**විශේෂ නිවේදනයයි**

1966 පෙබරවාරි 12 වැනි සෙනසුරාද සහ 18 වැනි සිකුරාද ආණ්ඩුවේ නිවාඩු දිනයන් වන බැවින්, 1966 පෙබරවාරි 17 වැනි දින නිකුත් කරනු ලබන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා ඒවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1966 පෙබරවාරි 11 වැනි සිකුරාද දහවල් 12 ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්නට සැලැස්විය යුතු බව කාගේත් දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

1966 ජනවාරි 27 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

**සෑම සිකුරාද දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.**

**ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).**

**ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායක මුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය. <u>ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායක මුදල් භාරගනු නොලැබේ.</u>**

ලංකාවේ වැලව්වත්තයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි